මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
| දිනය | 24 දෙසැම්බර් 2025 |

**මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2025 වර්ෂයේ ජූලි මස සිට සැප්තැම්බර් මස දක්වා වූ කාලපරිච්ඡේදය තුළ වාර්තාකරණ ආයතන සඳහා පරිපාලනමය දණ්ඩන පැනවීම**

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 19(1) සහ 19(2) වගන්ති මගින් පැවරී ඇති බලතල අනුව එම පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන ආයතන සඳහා පරිපාලනමය දණ්ඩන පනවනු ලැබේ. අදාල අනුකූල නොවන කටයුතුවල ස්වභාවය හා බැරෑරුම්කම සැලකිල්ලට ගෙන මෙම දණ්ඩන නියම කළ හැකිය.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නියාමන ආයතනය ලෙස ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් වාර්තාකරණ ආයතනවල අනුකූලතාව බලාත්මක කිරීම සඳහා 2025 වර්ෂයේ ජූලි මස සිට සැප්තැම්බර් මස දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පහත දක්වා ඇති පරිදි එකතු කරගන්නා ලද සමස්ත දඩ මුදල රුපියල් මිලියන නවයයි දශම පහ (රු. 9,500,000.00) කි. එලෙස දණ්ඩන මගින් එකතු කරගන්නා ලද මුදල ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදි.

| වාර්තාකරණ ආයතන | දණ්ඩන සහ අනුකූල නොවීම් වල විස්තර |
|---|---|
| එල් ඕ එල් සී ෆිනෑන්ස් පීඑල්සී | **දණ්ඩනය පනවන ලද දිනය** : 01.07.2025<br>**වටිනාකම** : රු. 2,000,000.00 (රුපියල් මිලියන දෙකකි)<br>**දණ්ඩනය ගෙවන ලද දිනය** : 16.07.2025<br>**දණ්ඩනය පැනවීමට හේතුව** :<br>i. එතැන් පරීක්ෂණයේදී සිදු කල නියැදි පරීක්ෂාවකින් හමුවූ රුපියල් මිලියනයක් හෝ එයට සමාන විදේශ මුදල් වලින් වූ මුදල් ප්‍රමාණයක් ඉක්මවන විද්‍යුත් අරමුදල් හුවමාරුවීමේ ගනුදෙනු දහතුනක් (13) නියමිත කාලපරිච්ඡේදය ඇතුළත මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීමට අපොහොසත් වීම, සහ<br>ii. ක්‍රියා විරහිත කළ ගිණුමක් හරහා හර ගනුදෙනු සිදු කිරීම මගින්, මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරන ලද තහනම් කිරීමේ නියමයන් සහ කොළඹ දී පවත්වන්නා වූ බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් පසුව දීර්ඝ කරන ලද තහනම් කිරීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීම<br><br>හේතුවෙන් මෙම දණ්ඩනය පනවන ලදි. |

| | |
|---|---|
| ෆින්ට්‍රෙක්ස් ෆිනෑන්ස් පීඑල්සී | **දණ්ඩනය පනවන ලද දිනය** : 07.07.2025<br>**වටිනාකම** : රු. 1,000,000.00 (රුපියල් මිලියන එකකි)<br>**දණ්ඩනය ගෙවන ලද දිනය** : 23.07.2025<br>**දණ්ඩනය පැනවීමට හේතුව :** එතැන් පරීක්ෂණයේදී සිදු කල නියැදි පරීක්ෂාවකින් හමුවූ රුපියල් මිලියනයක් හෝ එයට සමාන විදේශ මුදල් වලින් වූ මුදල් ප්‍රමාණයක් ඉක්මවන විද්‍යුත් අරමුදල් හුවමාරුවීමේ ගනුදෙනු පහක් (5) නියමිත කාලපරිච්ඡේදය ඇතුළත මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මෙම දණ්ඩනය පනවන ලදි. |
| රැන්ක් එන්ටර්ටේන්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් (කැසිනෝ මරීනා) | **දණ්ඩනය පනවන ලද දිනය** : 04.08.2025<br>**වටිනාකම** : රු. 500,000.00 (රුපියල් ලක්ෂ පහකි)<br>**දණ්ඩනය ගෙවන ලද දිනය** : 27.08.2025<br>**දණ්ඩනය පැනවීමට හේතුව :**<br>i. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා අංක 1373 ට අනුකූලව 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝග යටතේ නම් කරන ලද තැනැත්තන්, කණ්ඩායම් සහ ආයතන ලැයිස්තුවක් පවත්වාගෙන යාමට අපොහොසත් වීම, සහ<br>ii. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා යටතේ නම් කරන ලද තැනැත්තන්, කණ්ඩායම් සහ ආයතන ලැයිස්තුවක් යාවත්කාලීන වන අවස්ථාවක දී, ආයතනය සමග ව්‍යාපාරික සබඳතා පවත්වාගෙන යනු ලබන ගනුදෙනුකරුවකුගේ නම ඇතුළත්ව තිබේ ද යන්න තහවුරු කරගැනීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම<br>හේතුවෙන් මෙම දණ්ඩනය පනවන ලදි.<br><br>පද්ධති හා කාර්ය පටිපාටි වල ඉහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය වුව ද, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවන් යටතේ නම් කරන ලද තැනැත්තන්, කණ්ඩායම් සහ ආයතන සමග සමාගම විසින්, ව්‍යාපාරික සම්බන්ධතා පැවැත්වූ අවස්ථා එතැන් පරීක්ෂණයේ දී අනාවරණය නොවීය. |
| පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී | **දණ්ඩනය පනවන ලද දිනය** : 22.08.2025<br>**වටිනාකම** : රු. 1,000,000.00 (රුපියල් මිලියන එකකි)<br>**දණ්ඩනය ගෙවන ලද දිනය** : 08.09.2025<br>**දණ්ඩනය පැනවීමට හේතුව :**<br>i. ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය භාවිතා කර බැංකුවෙහි ඉලක්කගත මූල්‍ය සම්බාධක පැනවීම තහවුරු කිරීමේ පද්ධතිය මගින්, ගනුදෙනුකරුවකු, 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝග යටතේ නම් කරන ලද තැනැත්තන්, කණ්ඩායම් සහ ආයතන ලැයිස්තුවක, ඇතුළත්ව සිටී ද යන්න තහවුරු කරගැනීමට අපොහොසත් වීම, සහ |

| | |
|---|---|
| | ii. නමෙහි කොටසක් භාවිතා කර, ගනුදෙනුකරුවකු, 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝග, 2012 අංක 2 දරන එක්සත් ජාතීන්ගේ නියෝග, සහ 2017 එක්සත් ජාතීන්ගේ (කොරියානු ප්‍රජාතන්ත්‍රික මහජන සමූහාණ්ඩුව සම්බන්ධයෙන් වන සම්බාධක) නියෝග යටතේ නම් කරන ලද තැනැත්තන්, කණ්ඩායම් සහ ආයතන ලැයිස්තුවක, ඇතුළත්ව සිටී ද යන්න තහවුරු කරගැනීමට අපොහොසත් වීම<br>හේතුවෙන් මෙම දණ්ඩනය පනවන ලදී.<br><br>පද්ධති හා කාර්ය පටිපාටි වල ඉහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය වුව ද, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවන් යටතේ නම් කරන ලද තැනැත්තන්, කණ්ඩායම් සහ ආයතන සමග බැංකුව විසින්, ව්‍යාපාරික සම්බන්ධතා පැවැත්වූ අවස්ථා එතැන් පරීක්ෂණයේ දී අනාවරණය නොවීය. |
| බුලියන් එක්ස්චේන්ජ් | **දණ්ඩනය පනවන ලද දිනය** : 02.09.2025<br>**වටිනාකම** : රු. 2,000,000.00 (රුපියල් මිලියන දෙකකි)<br>**දණ්ඩනය ගෙවන ලද දිනය** : 25.09.2025<br>**දණ්ඩනය පැනවීමට හේතුව :**<br>i. මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අභ්‍යන්තර ප්‍රතිපත්තියක් සකස් කිරීමට අපොහොසත් වීම,<br>ii. පහත සඳහන් පාලනයන් සහ ක්‍රියාපටිපාටීන් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම<br>- සැක කටයුතු ගනුදෙනු හඳුනාගැනීමට සහ වාර්තා කිරීමට,<br>- 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ ඒ යටතේ නිකුත් කරන ලද රීතීන්, රෙගුලාසි සහ නියෝගයන්ට අනුකූලව, සමාගමෙහි ක්‍රියාපටිපාටීන් සහ පද්ධතීන් ක්‍රියාත්මක වන්නේද යන්න තහවුරු කරගැනීමට ස්වාධීන විගණනයන් සිදුකිරීමට,<br>- නිලධාරීන් සහ සේවකයින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සම්බන්ධයෙන් වූ නීති පිළිබඳ දැනුවත් කිරීමට,<br>- සේවකයන් ලෙස බඳවා ගැනීමට පෙර සියලුම පුද්ගලයන් පරීක්ෂා කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කිරීමට, සහ<br>iii. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා යටතේ නම් කරන ලද තැනැත්තන්, කණ්ඩායම් සහ ආයතන ලැයිස්තුවක ගනුදෙනුකරුවකු, ප්‍රතිලාභියකු සහ ආයතනය සමග දැනට ව්‍යාපාරික සබඳතා පවත්වාගෙන යනු ලබන ගනුදෙනුකරුවකු ඇතුළත්ව සිටී ද යන්න තහවුරු කරගැනීමට අපොහොසත් වීම<br>හේතුවෙන් මෙම දණ්ඩනය පනවන ලදී. |

| | |
|---|---|
| | පද්ධති හා කාර්ය පටිපාටි වල ඉහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය වුව ද, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවන් යටතේ නම් කරන ලද තැනැත්තන්, කණ්ඩායම් සහ ආයතන සමග සමාගම විසින්, ව්‍යාපාරික සම්බන්ධතා පැවැත්වූ අවස්ථා එතැන් පරීක්ෂණයේ දී අනාවරණය නොවීය. |
| නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී | **දණ්ඩනය පනවන ලද දිනය** : 04.09.2025<br>**වටිනාකම** : රු. 1,000,000.00 (රුපියල් මිලියන එකකි)<br>**දණ්ඩනය ගෙවන ලද දිනය** : 12.09.2025<br>**දණ්ඩනය පැනවීමට හේතුව :**<br>i. මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළ ගනුදෙනුවල දත්තයන්හි පැවති දෝෂ හෝ වැරදි නිසා ප්‍රතික්ෂේප වූ රුපියල් මිලියනයක් හෝ එයට සමාන විදේශ මුදල් වලින් වූ මුදල් ප්‍රමාණයක් ඉක්මවන මුදල් ගනුදෙනු සහ විද්‍යුත් අරමුදල් හුවමාරුවීමේ ගනුදෙනු, නියමිත කාලපරිච්ඡේදය ඇතුළත මූල්‍ය බුද්ධි ඒකකය වෙත නැවත වාර්තා කිරීමට අපොහොසත් වීම, සහ<br>ii. රුපියල් මිලියනයක් හෝ එයට සමාන විදේශ මුදල් වලින් වූ මුදල් ප්‍රමාණයක් ඉක්මවන කල්බදු ගෙවීම් සම්බන්ධ ගනුදෙනු, නියමිත කාලපරිච්ඡේදය ඇතුළත ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීමට අපොහොසත් වීම<br>හේතුවෙන් මෙම දණ්ඩනය පනවන ලදි. |
| මොබිටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් | **දණ්ඩනය පනවන ලද දිනය** : 12.09.2025<br>**වටිනාකම** : රු. 2,000,000.00 (රුපියල් මිලියන දෙකකි)<br>**දණ්ඩනය ගෙවන ලද දිනය** : 29.09.2025<br>**දණ්ඩනය පැනවීමට හේතුව :**<br>i. සමාගමේ *mcash* මෙහෙයුම් වලට අදාලව, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම පිළිබඳ අවදානම් තක්සේරුවක් සිදු කිරීමට අපොහොසත් වීම, සහ<br>ii. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා යටතේ නම් කරන ලද තැනැත්තන්, කණ්ඩායම් සහ ආයතන වල යාවත්කාලීන ලැයිස්තු, සමාගමෙහි ඉලක්කගත මූල්‍ය සම්බාධක පැනවීම තහවුරු කිරීමේ පද්ධතිය තුළ පවත්වාගෙන යාමට අපොහොසත් වීම<br>හේතුවෙන් මෙම දණ්ඩනය පනවන ලදි.<br><br>පද්ධති හා කාර්ය පටිපාටි වල ඉහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය වුව ද, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවන් යටතේ නම් කරන ලද තැනැත්තන්, කණ්ඩායම් සහ ආයතන සමග සමාගම විසින්, ව්‍යාපාරික සම්බන්ධතා පැවැත්වූ අවස්ථා එතැන් පරීක්ෂණයේ දී අනාවරණය නොවීය. |